# ඔබේ ගෙවත්තේ වැවිය හැකි ලූණු වර්ගයක්

**විවේක කාලයේ දී අත්හද බැලිය හැකි පහසු වගා ක්‍රම හඳුන්වා දෙන "අත්හද බැලීම්" තීරයට මෙවර එක් වන්නේ ඔබේ ගෙවත්තේ හෝ මල් පෝච්චිවල කළ හැකි වැවිල්ලකි. එය රතුළූණු වලට ආදේශකයක් වන පහසු වගාවකි. ඔබත් උත්සාහ කර බලන්න.**

ශ්‍රී ලංකා ජපන් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපාරයේ ජපන් ව්‍යාපාර අධිකාරි විශේෂඥ සනෝ මහතා විසින් 1972 වසරේ දී හඳුන්වා දුන් විශේෂ ව්‍යාපාරයට ගෙවතු වගා බෝගයක් හැටියට නිරා ලික්ස් හඳුන්වා දෙන ලදී. දැනට කොළඹ සහකාර කෘෂිකර්ම කාර්යාල භූමියේ ආදර්ශණ වගාවක් පිහිටුවා ඇත. මෙම වගාව ඉදිරි කන්නයේ දී ගොවීන් අතර ජනප්‍රිය කිරීම සඳහා බීජ සහ පැල බෙදා දීමටත්, අවශ්‍ය උපදෙස් ලබාදීමටත් කටයුතු කර ඇත. මෙම ලික්ස් වර්ගය යොදා ආහාර සකස් කිරීම ව්‍යාප්ත කිරීම ගෙවි කාන්තා ව්‍යාප්ති නිලධාරින් විසින් සංවිධානය කරනු ලැබේ.

**ආරම්භය:**

මෙය ජපානයේ සුදුළූණු රතුළූණු දෙමුහුන් කර සාදන ලද ලික්ස් විශේෂයකි. මෙය නිරා ලික්ස්, ජපන් ලික්ස්, චයිවස් යනුවෙන් නම් කිහිපයකින් හඳුන්වනු ලබයි. මෙහි උද්භිද නාමය: "ඇලියම් ස්කෙනෝ ප්‍රසම්" ය.

**වගා කිරීම:** බීජ මගින් සහ පැල වලින් බෝකරනු ලැබේ. පැල වලින් බෝ කිරීමේ දී පඳුරු ගලවා අලය තුවාල නොවන පරිදි පැලවල මුල් කපාගත යුතුය. එක වළක පැලයක් හෝ පැල දෙකක් සිටවන්න. පැල ව්‍යාප්තියේ දී පඳුරු ගොවු කොළ මෙන් පඳුරු වලින් පැල ගලවා පෙළින් පෙළවල සිටවා ව්‍යාප්ත කරගත හැකිය. තෙත් කලාපයේ සහ ජල සම්පාදනය යටතේ වියළි කලාපයේ හොඳින් වැඩේ.

**තවාන් සකස් කිරීම**

පස හොඳින් පෙරලා තැට පොඩිකර සියුම් කරගත යුතුයි. වියළි ගොම සහ කොම්පෝස්ට් පොහොර 2: 1 අනුපාතයට කලවම්කර, සල්ලඩයකින් හලා අඟල් 4'' තට්ටුවක් සිටින පරිදි පාත්තිය මත අතුරා තුනී කරන්න. ඉන් පසු පේළි අතර අඟල් 4'' ක් පරතරය සිටින පරිදි බීජ පේළියට තවාන් කරන්න. නිතර තෙතමනය අවශ්‍ය බැවින්, උදේ හවස වතුර සපයන්න. පැල මතුවන තුරු ලනු ගෝනියකින් වසා ජලය වඩාත් සැපයීම වඩාත් ප්‍රතිඵලදායක වේ. පැල මතුවූවාට පසු ගෝනි ඉවත්කර ජලය සැපයිය යුතුයි.

**නඩත්තුව**

බීජ දමා පැල මතුවූවාට පසු දින 14 කින් වතුර ගැ. 1 ට යූරියා මේස හැඳි 1ක් කලවම් කර වත් කරන්න. ඉන්පසු යූරියා මිශ්‍ර වතුර පසට යෙදී යන ලෙස නාවන වරක් වතුර යොදන්න. නිතර තෙතමනය අවශ්‍ය බැවින්. පේළි අතර කොහුබත් අතුරන්න. දින 45 ට පසු පැල ගලවා ක්ෂේත්‍රයේ සිටවිය හැක.

**ක්ෂේත්‍රයේ සිටුවීම**

පස අඟල් 9 පමණ ගැඹුරට පෙරළා පාත්තිය පුළුස්සා ගන්නට තබා තැනවී. පස්කැට පොඩි කර පස සියුම් වනසේ සකස් කරන්න. වියළි ගොම කුඩු සහ කොම්පෝස්ට් කලවම් කර පාත්තිය මතුපිට අතුරා පේළි අතර අඩි 1 සහ පැල අතර අඟල් 9 සිටින පරිදි පැල සිටුවන්න. පසේ තෙතමනය රැකගැනීම බැවින් පේළි අතර කොහු බත් අතුරා පස් බුරුල්කර සපයන්න. සති 2කට වරක් යූරියා මිශ්‍රණය යොදන්න. නිතර පස් බුරුල් කිරීමෙන් සහ තෙතමනය ආරක්ෂාකර ගැනීමෙන් පැලයේ වැඩීම ඉක්මන් වේ.

**අස්වැන්න නෙලීම**

සිටුවා දින 45 කින් ආහාරයට ගැනීම සඳහා පොළොව මට්ටමින් 3'' කට ඉහලින් පිහියකින් කපා ගත යුතුයි. සති 2 ට වරක් කපා ගත හැකිය. වැඩීම ඉක්මන්වීම සඳහා පොහොර සහ ජලය සැපය යුතුය.

**ආහාරයට ගැනීම**

ලූණු සහ ලික්ස් වෙනුවට ආදේශ කළ හැකිය. ආහාර පිළියෙළ කිරීමේ පයිඩරයිස්, චීන්තර ඔම්ලට්, නූඩ්ලස්, එළවළු සුප් වලට සහ අල දමා ව්‍යාංජනයක් හැටියටත්, පොල් සම්බල වලට කොළ ලියා කලවම් කිරීමෙනුත්, කරවල හාල් මැස්සන් තෙල් දමා ගැනීමේ දීද ලූණු වෙනුවටත් පාවිච්චි කල හැකිය.

**ඖෂධීය ගුණය**

වාත රෝග වලට ගුණදායක ඖෂධයක් බව ජපන් ජාතිකයින්ගේ විශ්වාසයයි.

වාත ආබාධ ඇති අයට පොල් මිටි කිරි ස්වල්පයක් යොදා නිරා ලික්ස් ව්‍යාංජනයක් ලෙස පිළියෙළ කර ආහාරයට ගත හැකි ය.

කොළඹ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ
(ව්‍යාප්ති)
**එම්. එස්. එම්. අස්මී**

සහ

කෘෂිකර්ම උපදේශිකා (ගෙවතු වගා)
**කේ. ආර්. කේ. මෙන්ඩිස්**